# පරිගණකය ආශ්‍රිත වාග්ව්‍යවහාරය සිංහල වාක්කෝෂය පෝෂණයට දායක වී ඇති අන්දම

ටී. මධුෂා සුභානි ප්‍රනාන්දු[1]

පරිගණකය මෑත කාලීන ඉතිහාසයේ මිනිසාගේ ජීවන පැවැත්ම හා චර්යා රටාව සම්පූර්ණයෙන් වෙනත් මඟකට හැරවූ උපකරණයකි. අධ්‍යාපනය, සෞඛ්‍යය, කෘෂිකර්මය, ගමනාගමනය, පරිපාලනය, වාණිජ හා කර්මාන්ත ආදි හැම අංශයක් සඳහා ම පරිගණකය අත්‍යවශ්‍ය සාධකයක් බවට මේ වන විටත් පත් වී ඇත. විද්‍යාව හා තාක්ෂණය ලොව ව්‍යාප්ත වීමත් සමඟ ලෝක භාෂා අතර වාක්කෝෂයේ වර්ධනයක් ද සිදු විය. වර්තමානය වන විට පරිගණකය ව්‍යප්ත වීමත් සමඟ ම ලෝකයේ භාෂාවල වාක්කෝෂය තව දුරටත් පුළුල් වී ඇත. එහි එක් එක් ක්ෂේත්‍ර උදෙසා නව වචන ගොඩනැගී ඇති අයුරු භාෂා මූලාශ්‍රය පරිහරණයේ දී පෙනී යයි. මේ හේතුව පදනම් කොටගෙන සිංහල භාෂාවේ ද වාක්කෝෂීය ව්‍යාප්තියක් සිදු විය. මේ පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂා කෙරෙන්නේ පරිගණකය ආශ්‍රිත ව සිංහල වාක්කෝෂය පෝෂණය වී ඇත්තේ කෙසේ දැ යි විමසා බැලීම යි. පරිගණකය ආශ්‍රිත වාක්කෝෂය දෙස බැලීමේ පෙනීයන්නේ දී දෘඪාංග හා මෘදුකාංග යන අංශ ද්වයය හරහා ම මේ වචන ගොඩනැගී ඇති බව ය. පරිගණකය ආශ්‍රිත මේ වචන දෙ ආකාරයකින් විකසනය වී ඇති බව පැවසිය හැකි ය. එනම් භාෂණ හා ලිඛිත ස්වරූපය වසයෙනි. භාෂණයෙහි ඉංග්‍රීසි වචන සෘජු ව ම සෘණීකරණය කිරීම, සංස්කෘත වචන සෘණීකරණය හෝ ඒ ඇසුරින් තද්භව, තත්සම ලෙස වචන යොදාගැනීම ද දක්නට ලැබේ. මින් ප්‍රකට වන්නේ පාරිභාෂික වචන ලේඛනයට සීමා වන බවත්, භාෂණය සඳහා ඇතැම් පාරිභාෂික වචන සෘණීකරණය වන බවත් ඇතැම් ඒවා සෘණීකරණය වීම හා දේශීය භාෂාවේ පදිම ශබ්දිම රටාවට අනුගත වීමත් සිදු වන බව ය. මෙයින් පැහැදිලි වන්නේ සිංහල භාෂාවේ පරිගණක විද්‍යාව සඳහා වන වාක්කෝෂයෙහි ද ද්විරූපතාව ක්‍රියාත්මක වී ඇති බව යි.

**ප්‍රමුඛ පදඃ** භාෂා ද්විරූපතාව, පාරිභාෂික වචන, සෘණීකරණය, මෘදුකාංග, දෘඪාංග

[1] වාග්විද්‍යා අධ්‍යයනාංශය